සන්නස SANNASA

### හෙළ දරුවනට සිප් නැණ බෙදන වික්ටෝරියානු සිංහල භාෂා පාසල

# එපිං සහ රොක්ස්බර්ග් පාක්



භාෂාව යනු සන්නිවේදනය සඳහා යොදාගන්නා වාචික හා ලිඛිත ක්‍රමවේද වශයෙන් සරල බසින් හැඳින්විය හැකිය. අධ්‍යාපනඥයින්ට අනුව භාෂා කිහිපයක් හැසිරවීමෙහි හැකියාව (multilingual skills) ප්‍රගුණ කරන දරුවන්ගේ ප්‍රජානන නිපුණතාව (cognitive skills) ඉතා ඉහල මට්ටමක පවතින බව පිළිගත් මතයකි.

උතුරු මෙල්බනයේ වෙසෙන ශ්‍රී ලාංකික දරුවන්ට තම මව් බස ඉගෙනීමට අවස්ථාව සලසන සිංහල භාෂා පාසල, ඕස්ට්‍රේලියානු බහු සංස්කෘතික සමාජය තුළ ශ්‍රී ලාංකික අනන්‍යතාව නියෝජනය උදෙසා නැගී සිටින්නේ මහත් අභිමානයෙනි.

මෑතදී, අප අතරින් වියෝ වූ පැට්‍රික් දේවපුර මහතාගේ පුරෝගාමීත්වයෙන්, වික්ටෝරියානු භාෂා පාසලට අනුබද්ධිතව 1991 වසරේ අප්පීල්ඩ් මධ්‍යස්ථානයේදී ඇරඹුණු සිංහල භාෂා පාසල අද එපිං හා රෝස්බර්ග් පාක් මධ්‍යස්ථාන ද්විත්වය යටතේ පහළ ප්‍රාථමිකයේ සිට VCE ශ්‍රේණිය දක්වා වර්ධනය වී තිබේ. විසි හත් වසරක් පුරා මෙතෙක් ආ දිගු ගමනේදී සිංහල භාෂා පාසල විසින් ඕස්ට්‍රේලියානු බහු සංස්කෘතික සමාජය තුළ ශ්‍රී ලාංකික අනන්‍යතාව සනිටුහන් කළ අවස්ථා බොහෝය. "රිද්ම චාරිකා 2017", "තම්බපන්ණි 2015", "රන්තරු 2013", "ආවර්ජනා 2011", "සුවඳ පද්ම 2009", "ඇසළ රංගන 2007", "සුවඳ කැකුළු 2005", "වසන්ත මිහිර 2004", "බක්මහ රැඟුම් 2003" නිදසුන් ලෙස දැක්විය හැකිය.

සිංහල භාෂා පාසල ශශ්‍රී ලාංකික සිංහල දරුවනට පමණකුත් නොව අනෙක් දරුවන්ටත් "අපේ පාසල" බවට පත්ව තිබීම පාසලේ ප්‍රජා මෙහෙවර පෙන්වන තවත් සාධකයකි.

"මැලේ හා මුස්ලිම් සම්භවයක් ඇති මමත් මගේ සැමියාත් සිංහල භාෂා පාසල දකින්නේ එක්තරා ආශිර්වාදයක් (blessing) ලෙසටයි. මන්ද විදේශ රටක ජීවත් වන අපේ දරුවන්ට සිංහල භාෂා පාසලෙන් භා-ෂාව ඉගෙනීමත් සමගම අපේ සාරධර්ම හා වටිනාකම් (cultural ethics and values) ජීවිතයට ලැබෙනවා. සිංහල සමාජයේ සාමාජිකත්වය (community belonging) තුලින් මගේ දරුවාගේ ආත්ම ශක්තිය (self confidence) දියුණු කරන්නටත්, තව යහළු යෙහෙළියන් (friendship circles) ඇති කර ගැනීමටත්, බහු සංස්කෘතික සමාජයේ ජීවත් වන අතර දී ලාංකිකත්වය රැක ගැනීමට ත් මහඟු රුකුලක් සපයා දී තිබෙනවා. ශ්‍රී ලංකාවේ ජීවත් වන නෑදෑ හිතමිතුරන් සමඟ සිංහල බසින් කතා කරන අපේ දරුවා දකින විට අපට දැනෙන්නේ ලොකු සතුටක්"
Mrs Dilshad Hasimdeen - Mr Sadath Hasimdee
(parents of Sadiyah Hasimdeen Grade 6&7)

"මමත් මගේ ඕස්ට්රෝලියානු ජාතික බිරිඳත් ශ්‍රී ලාංකික සංස්කෘතික වටිනාකම් හා සාරධර්ම ඉහලින් අගය කරනවා. (එහි අගය වඩාත් දැනෙන්නේ මව් රටෙන් බැහැරව සිටිනා විටයි.) ශ්‍රී ලාංකික සංස්කෘතික වටිනාකම් හා ආකල්ප දැන ගැනීමටනම් සිංහල භාෂාව දැන ගැනීම අවශ්‍ය වෙනවා. මන්ද, වෙනත් භාෂාවන් මෙන් නොව අපේ භාෂාව තුළ අපේ සංස්කෘතියත් ගැබ්ව තිබෙන නිසයි. සිංහල භාෂාව නොදැනීම නිසා අපේ ඊළඟ දරු පරපුර යම් කලකදී ලංකාව සමග ඇති සම්බන්ධතා, නෑදෑකම් අත්හරින්නට ඉඩ තිබෙනවා. දෙදහස් පන්සීය වසරකට වඩා පැරණි අපේ ප්‍රෞඪ ඉතිහාසය හා සංස්කෘතිය දැන ගැනීම ට හා ලංකාවේ සුන්දරත්වය අත්විඳින්න එවිට ඔවුනට වාසනාව නොලැබී යන්නත් පුළුවන්. දරුවන්ට සිංහල භාෂාව ඉගෙනීමට අවස්ථාව ලබා දීම තුලින් ඒ බාධාව නැති කරවීම අපේ අරමුණයි. සිංහල භාෂා පාසලට සම්බන්ධ වීම තුළින් දැනෙන්නේ-න්, අපි හා අපේ දරුවන් විශාල පවුලක සාමාජිකත්වය ලැබුවා වැනි හැඟීමක්. සිංහල භාෂා පාසලට සම්බන්ධ වීමට අනෙක් ලාංකික පවුල් වලටත් අපි ආරාධනා කරන්නේ අප ලැබූ තෘප්තිමත් අත්දැකීම් තුළිනුයි.
(Mrs Kathryn Jayasooriya)
(Mr Indika Jayasooriya)
Parents of Asher - Prep & Elijah Grade 2 Isaiah Grade 3

සිංහල භාෂා පාසලේදී දරුවෝ, වික්ටෝරියානු F)10 විෂය නිර්දේශය ට අනුව සවන්දීම (Listning), කථනය (speaking) කියවීම (Reading) හා ලිවීම (writing) යටතේ සිංහල ව්‍යාකරණ දැනුම, සිංහල සාහිත්‍ය ය හා සංස්කෘතියද ඉගෙන ගනිති. එපමණක් නොව වෙනත් භාෂාවන් රට රටවල් මෙන්ම ඒ ඒ සංස්කෘතීන් (Intercultural knowledge and awareness) ගැනද සිංහල පන්ති කාමරයේදී සාකච්ඡාවට බඳුන් කරති.

සෑම පාසල් වාරයකට වරක් පැවැත්වෙන සිංහල ශිෂ්‍ය සමිතිය තම භාෂා දැනුම හා නිර්මාණ කුසලතා එළි දක්වන පළමු කරළිය කර ගන්නා දරුවන්, වාර්ෂික සිංහල අවුරුදු සැමරුම්, දෙවාර්ෂික විවිධ ප්ර-ාසංග වේදිකාවේ හා දිනපතා පාසල් (day school) වේදිකාවේ ජය කෙහෙළි නංවන්නේ සිංහල භාෂා පාසලේ විෂය බාහිර ක්‍රියාකාරකම් කොතෙක් දුරට දරුවාගේ ස්වයං ශික්ෂණය ට, සබකෝලය නැති කිරීම තුළින් පෞරුෂ වර්ධනයට නායකත්වයට ධනාත්මක බලපෑම් කෙරේ දැයි සනාථ කරවමිනි.

විදෙස් රටක ජීවත් වුවත් තම ලාංකිකත්වය ගැන ආදරයක් හා ගෞරවයක් සිංහල භාෂා පාසල තුළින් දරුවන්ට ලබා දී ඇති බව සහ තව දුරටත් ලබා දෙන බව 2009 වර්ෂයේදී ස්ථාපනය වූ රොක්ස්බ්ර්ග් පාක් සහ මිල් පාක් (එපිං) ආදී ශිෂ්‍ය සංගමය මොනවට සාක්ෂි දරයි. ඕස්ට්‍රේලියානු වැඩිහිටි සමාජයේ වගකීම් සහිත රැකියාවල නිරත වුවත් සියල්ල පසෙකලා තම බාල සහෝදර සහෝදරියන් වෙනුවෙන් කැප වෙමින් භාෂා පාසලේ සෑම කටයුත්තකදීම (දක්වන) ඇති ආදී ශිෂ්‍ය කැපවීම අති ප්‍රසංශනීයයි.

අනුරාධපුර සාලියපුර ගම්මානයේ අඩු පහසුකම් සහිත පාසලක සිසු දරුවන්ට පාසල් උපකරණ ලබා දීමේ මහා සත්කාරයට අරමුදල් රැස් කර දෙනු වස් පසුගිය අගෝස්තු 4වන දා ආදී ශිෂ්‍ය සංගමය විසින් පවත්වන්නට යෙදුණු කොත්තු රාත්‍රිය විදෙස් රටක ජීවත් වුවත් තම මව් රට ගැන ඔවුන්ගේ ඇති සංවේදීතාවය පෙන්වූ සුවිශේෂී අවස්ථාවකි.

රෝස්බර්ග් පාක් සිංහල භාෂා පාසල විසින් මේ වාරයේදී පවත්වන්නට යෙදෙන්නා වූ වැඩසටහන් කිහිපයකි. එයින් පළමුවැන්න ඔක්තෝබර් මස 27 වන සෙනසුරාදා පෙ.ව. 10.00 සිට ප.ව.12.15 දක්වා පැවැත්වුන විවෘත දිනය යි. සිංහල භාෂාව ඉගෙනීමට කැමති දරු දැරියන්ට හා ඔවුන්ගේ දෙමාපියනට භාෂා පාසලේ වත්මන් සිසු දරු දැරියන්ගේ නිර්මාණ දැක ගනිමින් ඔවුන්ගේ පාසල් අත්දැකීම් බෙදා හද ගන්නටත් ගුරු මහත්ම මහත්මීන් හමු වී වැඩි විස්තර දැන ගැනීමටත් මෙදින අවස්ථාව සැලසුණි.

දෙවැන්න එදින ම පෙ.ව. 11.30 -12.30 දක්වා පැවැත්වූ වී. සී. ඊ. විභාගය සඳහා සිංහල භාෂාව හැදෑරීම පිළිබඳව දෙමාපියන් හා දරුවන් දැනුවත් කිරීමේ වැඩමුළුව යි. (VCE Information session) එහිදී, වී. සී. ඊ. විභාගය සඳහා නියමිත සිංහල භාෂා විෂය මාලාව, එහි අධ්‍යයන සැලැස්ම (Study Design) සිංහල භාෂාව දෙවන භාෂාවක් ලෙස වී.සී.ඊ. මට්ටම දක්වා හැදෑරීමෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශයට ඇති විශේෂ වාසි, විභාගය සඳහා දරුවා කෙසේ සූදානම් විය යුතුද යන්න හා භාෂා පාසලෙන් දරුවන්ට ලැබෙන විශේෂ මගපෙන්වීම් පිළිබඳව වී.සී.ඊ පන්ති භාර ආචාරිණී විපුලි ගුණසේකර මහත්මිය පුළුල් ලෙස සාකච්ඡාවට ලක් කළාය.

Marini Wetthasinghe
Teacher Year 6&7 Victorian School of languages Roxburgh Park Centre

වික්ටෝරියානු භාෂා පාසල යටතේ උතුරු මෙල්බන්හි පැවැත්වෙන සිංහල භාෂා පාසල් මධ්‍යස්ථාන දෙකකි.

**එපිං මධ්‍යස්ථානය**
**Epping Secondary College**
**Junior Campus**
Mc Donalds Road Epping VIC 3076
Tel• 9401 2599
පහළ ප්‍රාථමිකයේ - 10 වන ශ්‍රේණිය දක්වා
වැඩිදුර විමසීම්
හිමාලී කරුණාසේන 0409 077 420

**රොක්ස්බර්ග් පාක් මධ්‍යස්ථානය**
**Roxburgh College**
Donald Cameron Drive Roxburgh Park VIC 3064
Tel• 9830 8100
පහළ ප්‍රාථමිකයේ - VCE දක්වා
වැඩිදුර විමසීම්
විපුලි ගුණසේකර0421 311 916

